(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 138.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2026 මාර්තු 17 අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා, කථානායකතුමා**

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා, නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා**

ගරු **හේමාලි වීරසේකර මහත්මිය, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය,** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **විජිත හේරත් මහතා,** විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය,** ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අර්කම් ඉල්යාස් මහතා,** බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත ජයවීර මහතා,** ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුගත් තිලකරත්න මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) රුවන් රණසිංහ මහතා,** සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරවින්ද සෙනරත් මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පී. රුවන් සෙනරත් මහතා,** පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිනිඳු සමන් හෙන්නායක මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **රොෂාන් අක්මීමන මහතා**

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු **අබූබකර් අතම්බාවා මහතා**

ගරු **නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**

ගරු **(මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**

ගරු **(වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

ගරු **(වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**

ගරු **ජේ.සී. අලවතුවල මහතා**

ගරු **එම්.කේ.එම්. අස්ලම් මහතා**

ගරු **හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**

ගරු **ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**

ගරු **බී. ආරියවංශ මහතා**

ගරු **(වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**

ගරු **කේ. ඉලංකුමාරන් මහතා**

ගරු **එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **රවී කරුණානායක මහතා**

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු උපුල් කිත්සිරි මහතා

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු චමින්ද ලලිත් කුමාර මහතා

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු ගයාන් ජනක මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු සුනිල් බියන්විල මහතා

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු මංජුල සුගත් රත්නායක මහතා

ගරු සුරංග රත්නායක මහතා

ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය

ගරු අසෝක සපුමල් රන්වල මහතා

ගරු තුරෛරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු මනෝජ් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා

ගරු කංචන වැලිපිටිය මහතා

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු අතුල වෙළඳගොඩ මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**

**ගරු තිළිණ සමරකෝන් මහතා**

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**

**ගරු දේවානන්ද සුරවීර මහතා**

**ගරු චන්දන සූරියආරච්චි මහතා**

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදනය කරන ලදී:—

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, ම'විසින් 2026 මාර්තු 06 දින 'විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන)' හා 'අධිකරණ සංවිධාන (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත්හි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් —

(i) 2023 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්; සහ

(ii) 2024 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්

ඉදිරිපත් කර, එම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් —

(i) 2024 වර්ෂය සඳහා හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් —

(i) (357 අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ 29 සහ 155 වගන්ති යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) (358 අධිකාරය වූ) නාවික හමුදා පනතේ 161 වගන්තිය යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(iii) (359 අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ 29 සහ 155 වගන්ති යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග

ඉදිරිපත් කර, එම නියෝග ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 7(1) (ඇ) වගන්තිය සහ VI වන කොටස සමඟ කියවිය යුතු 105 වගන්තිය යටතේ අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒම සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් සාදන ලදුව, 2026 ජනවාරි 30 දිනැති අංක 2473/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රීති ඉදිරිපත් කර, එම රීති රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) 2021 වර්ෂය සඳහා මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2024 වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාවේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා විසින් —

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කොළඹ මහා නගර සභාව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සබරගමුව පළාත් සභාව යටතේ වූ පළාත් පාලන ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 34 වගන්තිය යටතේ තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව 2026 සම්බන්ධයෙන් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජනවාරි 16 දිනැති අංක 2471/51 දරන අති

විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කර, එම නියෝග තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 71 වගන්තිය යටතේ නියෝග (2025 දෙසැම්බර් 29 දිනැති අංක 2469/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද); සහ

(ii) 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීම (2026 මාර්තු 06 දිනැති පාර්ලිමේන්තුවේ අංක 3(8) දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකයේ ඇතුළත් කරන ලද)

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) ජුලම්පිටිය, ගල්පොත්තයාය, අංක 108/1 ඒ දරන ස්ථානයෙහි පදිංචි තිලක් ඉන්දික විදානගම මහතාගෙන් ලැබුණු 2025.09.24 දිනැති පෙත්සම ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) නාරම්මල, දෙමටගහවෙල යන ලිපිනයෙහි පදිංචි සී.එම්.එම්.ආර්. ජයසිංහ මහතාගෙන් ලැබුණු 2025.08.10 දිනැති පෙත්සම ගරු අශෝක ගුණසේන මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) කොළඹ 13, හින්නි අප්පුහාමි මාවත, අංක 90, 1/1 දරන ස්ථානයෙහි පදිංචි ජී. දෙනිසරත් මහත්මියගෙන් ලැබුණු 2025.08.22 දිනැති පෙත්සම;

(ii) යාපනය, කරවෙඩ්ඩි, තුන්නලයි උතුර යන ලිපිනයෙහි පදිංචි කේ.කදිරමලයි මහතාගෙන් ලැබුණු 2025.09.19 දිනැති පෙත්සම;

(iii) මඩකලපුව, ආරයම්පති, කනපදිපිල්ලෙයි විදුහල්පති වීදිය, මුත්තාරම් යන ලිපිනයෙහි පදිංචි කනපදිපිල්ලෙයි බාලකංගේෂ්වරී මහත්මියගෙන් ලැබුණු 2025.08.26 දිනැති පෙත්සම; සහ

(iv) යාපනය, චිතන්කෙර්නි, වට්ටු-උතුර, පුම්පොලිල් යන ලිපිනයෙහි පදිංචි ටී. කජේන්දිරන් මහතාගෙන් ලැබුණු 2025.06.12 දිනැති පෙත්සම

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. දේශීය ආදායම් (සංශෝධන):** මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2026 අප්‍රේල් 07 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**6. සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන):** මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2026 අප්‍රේල් 07 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**7. බේරාගැනීම, පුනරුත්ථාපනය සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික):** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— තැනැත්තන් සහ සමාගම් බේරා ගැනීමට, පුනරුත්ථාපනය කිරීමට සහ තැනැත්තන්ගේ සහ සමාගම්වල වස්තුභංගත්වයට අදාළ නීතිය සංශෝධනය කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහා ද; (97 වන අධිකාරය වූ) වස්තුභංගත්ව ආඥාපනත ඉවත් කිරීම සඳහා ද; 2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා ද; 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා ද; 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2026 අප්‍රේල් 07 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**8. දූෂණ විරෝධී පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීම:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් ඉදිරිපත් කළ යෝජනාව,— දූෂණ විරෝධී පනත පැනවීමේ දී පෙර පැවති පනත් තුනක් එනම්; (26 වැනි අධිකාරය වූ) අල්ලස් පනත, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත පරිච්ඡින්න කොට ඒ වෙනුවට එම පනත්වල ඇතුළත්ව තිබූ සියලු වැරදි සම්බන්ධව කටයුතු කිරීමේ බලතල සහ වගකීම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සතු වන පරිදි 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත බලාත්මක කර ඇති හෙයින් ද;

1994 අංක 19 දරන පනතින් ස්ථාපිත කර තිබූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැවති බලතල හා වගකීම්වලට වඩා වැඩි සුවිශාල වගකීම් ප්‍රමාණයක් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත මඟින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැවරී ඇති හෙයින් ද;

එම බලතල සහ වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා 'ඇමුණුම-I' හි දැක්වෙන කාර්ය මණ්ඩලය අවශ්‍ය වන බවට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති හෙයින් ද, කොමිෂන් සභාවට පැවරී ඇති සුවිශේෂ කාර්යයන් සැලකීමේ දී එම කාර්ය මණ්ඩලය සඳහා ඉහළ නිපුණතාවයකින් සහ අත්දැකීම්වලින් සපිරුණු නිලධාරින් ආකර්ෂණය කර ගැනීමට සහ එවැනි නිලධාරින් බඳවා ගැනීමට හැකිවන පරිදි පාරිශ්‍රමික ව්‍යුහයක් පැවතීම අවශ්‍යව ඇති හෙයින් ද;

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අවශ්‍ය බවට සලකන නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික සහ සේවා කොන්දේසි පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතු බව පනතේ 26 (2) වගන්තියෙහි දක්වා ඇති හෙයින් ද;

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තිය යටතේ තීරණය කරන ලද 'ඇමුණුම-I' හි දැක්වෙන නිලධරයන් සහ සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික සම්බන්ධ යෝජනාවලියට 'ඇමුණුම-II' කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2025.08.11 දිනැති හා 2025.12.19 දිනැති ලිපි මඟින් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය ලැබී ඇති බව දන්වා ඇති බැවින් ද, එම යෝජනාවලිය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් දූෂණ විරෝධී පනතේ 26(2) වගන්තිය ප්‍රකාරව සුදුසු බවට තීරණය කර ඇති හෙයින් ද;

එම පාරිශ්‍රමික යෝජනාවලිය යටතේ වන දීමනා ගෙවීම සඳහා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල කාර්ය මණ්ඩලයට එම දීමනා හිමි ගන්වා ඇති චක්‍රලේඛ විධිවිධාන අදාළ කර ගැනීමේ දී අදාළ චක්‍රලේඛවල උක්ත දීමනා හිමි නිලධර කාණ්ඩ/තනතුරු තීරණය කිරීම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සිදු කිරීම කළයුතු හෙයින් ද;

දූෂණ විරෝධී පනතේ 26(2) වගන්තියෙහි වන සේවා කොන්දේසි, පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් නිශ්චය කර එම රීතින් පනතේ 32(2) සහ 157(1) වගන්ති අනුව සකස් කිරීමේ බලතල එම කොමිෂන් සභාවට පැවරිය යුතු හෙයින්ද; සහ

1994 අංක 19 දරන පනත යටතේ ස්ථාපිත කොමිෂන් සභාවේ ධුර දරන ලද සහ 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ ස්ථාපිත කරන ලද කොමිෂන් සභාවට පත්කරනු ලබන නිලධාරින් සහ සේවකයින් (නිලධාරින් 63 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්) දූෂණ විරෝධී පනතේ 163(2)(ඌ) වගන්තියට අනුකූලව සහ එහි දැක්වෙන පරිදි නව කොමිෂන් සභාවේ විශ්‍රාම වැටුප් සහිත සුදුසු තනතුරක (දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තිය යටතේ අනුමත කළ) හා සුදුසු වැටුප් පියවරක පිහිටුවීම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු හෙයින්;

ඒ අනුව, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 26(2) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීම මෙම පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

ඇමුණුම - I

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් එහි කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය බවට තීරණය කරනු ලබන කාර්ය මණ්ඩලය

| | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| 2 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| 3 | ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ | 02 |
| 4 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 06 |
| 5 | අධ්‍යක්ෂ | 09 |
| 6 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 |
| 7 | ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ජනරාල් | 16 |
| 8 | සහකාර අධ්‍යක්ෂ ජනරාල් | 58 |
| 9 | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | 45 |
| 10 | අභ්‍යන්තර විගණක | 01 |
| 11 | පර්යේෂණ නිලධාරී | 03 |
| 12 | පරිපාලන නිලධාරී | 04 |
| 13 | ප්‍රවාහන නිලධාරී | 01 |
| 14 | තාක්ෂණ නිලධාරී | 01 |
| 15 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 04 |
| 16 | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී | 47 |

| තනතුරු නාමය | | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 17 | ජ්‍යෝෂ්ඨ දූෂණ නිවාරණ නිලධාරී | 12 |
| 18 | විමර්ශන නිලධාරී | 337 |
| 19 | දූෂණ නිවාරණ නිලධාරී | 50 |
| 20 | පුස්තකාලයාධිපති | 01 |
| 21 | භාෂා පරිවර්තක හා භාෂණ පරිවර්තක | 06 |
| 22 | නීති සහකාර | 07 |
| 23 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 06 |
| 24 | සහකාර පුස්තකාලයාධිපති | 01 |
| 25 | දූෂණ විරෝධී කළමනාකරණ සේවා නිලධාරී ** | 113 |
| 26 | යතුරු ලේඛක හා ලඝුලේඛක | 45 |
| 27 | සන්නිවේදන සහකාර | 07 |
| 28 | රියදුරු | 69 |
| 29 | කාර්යාල කාර්ය සහයක | 117 |
| **එකතුව** | | **971** |

** දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව බඳවා ගැනීමට තීරණය කර ඇති තනතුර "දූෂණ විරෝධී කළමනාකරණ සේවා නිලධාරී" වේ. මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය ලැබී ඇති බවට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති තනතුරු නාමය වන්නේ "කළමනාකරණ සහකාර" තනතුර ය. තනතුරු නාමයන් වෙනස් වුව ද පැවරෙන රාජකාරී සමාන ස්වභාවයක් ගනු ලබන බැවින් හා තවත් කරුණු ගණනාවක් සලකා බලා කොමිෂන් සභාව තීරණය කර ඇත්තේ "දූෂණ විරෝධී කළමනාකරණ සේවා නිලධාරී" යන තනතුරු නාමය වේ.

ඇමුණුම - II

දූෂණ විරෝධී පනතේ 26(2) වගන්තිය ප්‍රකාරව මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය සහිතව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පාරිශ්‍රමික යෝජනාවලිය

01. යෝජිත වැටුප් ව්‍යුහය

| තනතුර | | වැටුප් කේතය | මූලික පියවර | වර්ෂ | 1වැනි පියවර | වර්ෂ | 2වැනි පියවර | වර්ෂ | 3වැනි පියවර | වර්ෂ | 4වැනි පියවර | උපරිම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | AC-E 4 - 2025 | 212,000 | 10 | 4,950 | | | | | | | 261,500 |
| 2 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්/ ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ | AC-E 3 - 2025 | 194,000 | 10 | 4,500 | | | | | | | 239,000 |
| 3 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්/ අධ්‍යක්ෂ/ ප්‍රධාන අභ්‍යන්තර විගණක | AC-E 2 - 2025 | 176,000 | 10 | 4,250 | | | | | | | 218,500 |
| 4 | ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ජනරාල් | AC-E 1-2 - 2025 | 151,900 | 10 | 3,900 | | | | | | | 190,900 |
| 5 | සහකාර අධ්‍යක්ෂ ජනරාල් | AC-E 1-1 - 2025 | 131,300 | 10 | 2,940 | | | | | | | 160,700 |
| 6 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ/ අභ්‍යන්තර විගණක/ පර්යේෂණ නිලධාරී | AC-E 1 - 2025 | 131,300 | 10 | 2,940 | 10 | 3,595 | | | | | 196,650 |
| 7 | පරිපාලන නිලධාරී | AC-JM 1-2 - 2025 | 74,010 | 10 | 1,360 | 18 | 2,040 | | | | | 124,330 |
| 8 | ප්‍රවාහන නිලධාරී | AC-JM 1-2 - 2025 | 74,010 | 10 | 1,360 | 18 | 2,040 | | | | | 124,330 |
| 9 | තාක්ෂණ නිලධාරී | AC-JM 1-2 - 2025 | 74,010 | 10 | 1,360 | 18 | 2,040 | | | | | 124,330 |
| 10 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | AC-JM 1-2 - 2025 | 74,010 | 10 | 1,360 | 18 | 2,040 | | | | | 124,330 |
| 11 | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී | AC-MA 5 -3 - 2025 | 79,440 | 10 | 2,040 | 20 | 2,230 | | | | | 144,440 |
| 12 | ජ්‍යෙෂ්ඨ දූෂණ නිවාරණ නිලධාරී | AC-MA 5 -3 - 2025 | 79,440 | 10 | 2,040 | 20 | 2,230 | | | | | 144,440 |
| 13 | විමර්ශන නිලධාරී | AC-MA 5 -1 - 2025 | 58,740 | 10 | 1,190 | 15 | 1,360 | 11 | 1,670 | | | 109,410 |
| 14 | දූෂණ නිවාරණ නිලධාරී | AC-MA 5 -1 - 2025 | 58,740 | 10 | 1,190 | 15 | 1,360 | 11 | 1,670 | | | 109,410 |
| 15 | පුස්තකාලයාධිපති | AC-MA 4 - 2025 | 64,320 | 10 | 1,360 | 15 | 1,670 | 5 | 2,040 | | | 113,170 |

| | තනතුර | වැටුප් කේතය | මූලික පියවර | වර්ෂ | 1වැනි පියවර | වර්ෂ | 2වැනි පියවර | වර්ෂ | 3වැනි පියවර | වර්ෂ | 4වැනි පියවර | උපරිම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 16 | භාෂා පරිවර්තක හා භාෂණ පරිවර්තක | AC-MA 4 - 2025 | 64,320 | 10 | 1,360 | 15 | 1,670 | 5 | 2,040 | | | 113,170 |
| 17 | නීති සහකාර | AC-MA 3 - 2025 | 53,940 | 10 | 800 | 11 | 1,190 | 10 | 1,320 | 5 | 1,350 | 94,980 |
| 18 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | AC-MA 2 -1 - 2025 | 50,540 | 10 | 540 | 7 | 630 | 4 | 890 | 20 | 1,190 | 87,710 |
| 19 | සහකාර පුස්තකාලයාධිපති | AC-MA 1 -1 - 2025 | 46,220 | 10 | 540 | 7 | 630 | 4 | 890 | 20 | 1,190 | 83,390 |
| 20 | කළමනාකරණ සහකාර | AC-MA 1 -1 - 2025 | 46,220 | 10 | 540 | 7 | 630 | 4 | 890 | 20 | 1,190 | 83,390 |
| 21 | යතුරු ලේඛක හා ලඝුලේඛක | AC-MA 1 -1 - 2025 | 46,220 | 10 | 540 | 7 | 630 | 4 | 890 | 20 | 1,190 | 83,390 |
| 22 | සන්නිවේදන සහකාර | AC-MA 1 -1 - 2025 | 46,220 | 10 | 540 | 7 | 630 | 4 | 890 | 20 | 1,190 | 83,390 |
| 23 | රියදුරු | AC-PL 3 - 2025 | 43,280 | 10 | 490 | 10 | 540 | 10 | 590 | 12 | 630 | 67,040 |
| 24 | කාර්යාල කාර්ය සහායක | AC-PL 1 - 2025 | 40,500 | 10 | 450 | 10 | 490 | 7 | 540 | 15 | 590 | 62,530 |

02. යෝජිත දූෂණ විරෝධී අවදානම් දීමනාව

| තනතුර | | වැටුප් කේතය | දූෂණ විරෝධී අවදානම් දීමනාව |
|---|---|---|---|
| 1 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | AC-E 4 - 2025 | 140,000 |
| 2 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | AC-E 3 - 2025 | 128,750 |
| 3 | ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ | AC-E 3 - 2025 | 48,000 |
| 4 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | AC-E 2 - 2025 | 117,500 |
| 5 | අධ්‍යක්ෂ/ ප්‍රධාන අභ්‍යන්තර විගණක | AC-E 2 - 2025 | 44,000 |
| 6 | අධ්‍යක්ෂ (විමර්ශන) | AC-E 2 - 2025 | 70,000 |

| | තනතුර | වැටුප් කේතය | දූෂණ විරෝධී අවදානම් දීමනාව |
|---|---|---|---|
| 7 | ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ජනරාල් | AC-E 1-2 - 2025 | 105,250 |
| 8 | සහකාර අධ්‍යක්ෂ ජනරාල් | AC-E 1-1 - 2025 | 94,000 |
| 9 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ/ අභ්‍යන්තර විගණක/පර්යේෂණ නිලධාරී | AC-E 1 - 2025 | 33,000 |
| 10 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (විමර්ශන) | AC-E 1 - 2025 | 52,000 |
| 11 | පරිපාලන නිලධාරී | AC-JM 1-2 - 2025 | 19,000 |
| 12 | ප්‍රවාහන නිලධාරී | AC-JM 1-2 - 2025 | 19,000 |
| 13 | තාක්ෂණ නිලධාරී | AC-JM 1-2 - 2025 | 19,000 |
| 14 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | AC-JM 1-2 - 2025 | 19,000 |
| 15 | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී | AC-MA 5-3 - 2025 | 31,000 |
| 16 | ජ්‍යෙෂ්ඨ දූෂණ නිවාරණ නිලධාරී | AC-MA 5-3 - 2025 | 20,000 |
| 17 | විමර්ශන නිලධාරී | AC-MA 5-1 - 2025 | 23,000 |
| 18 | දූෂණ නිවාරණ නිලධාරී | AC-MA 5-1 - 2025 | 15,000 |
| 19 | පුස්තකාලයාධිපති | AC-MA 4 - 2025 | 16,000 |
| 20 | භාෂා පරිවර්තක හා භාෂණ පරිවර්තක | AC-MA 4 - 2025 | 16,000 |
| 21 | නීති සහකාර | AC-MA 3 - 2025 | 14,000 |
| 22 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | AC-MA 2-1 - 2025 | 13,000 |
| 23 | සහකාර පුස්තකාලයාධිපති | AC-MA 1-1 - 2025 | 12,000 |
| 24 | කළමනාකරණ සහකාර | AC-MA 1-1 - 2025 | 12,000 |
| 25 | යතුරු ලේඛක හා ලඝුලේඛක | AC-MA 1-1 - 2025 | 12,000 |
| 26 | සන්නිවේදන සහකාර | AC-MA 1-1 - 2025 | 12,000 |
| 27 | රියදුරු | AC-PL 3 - 2025 | 11,000 |
| 28 | කාර්යාල කාර්ය සහායක | AC-PL 1 - 2025 | 10,000 |

03. යෝජිත කාර්ය සාධන දීමනාව

ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරි සහ විමර්ශන නිලධාරි යන තනතුරු සඳහා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන රු. 10,000/- ක් දක්වා වන කාර්ය සාධන දීමනාවක් ගෙවීම.

04. ඉහත 02 සහ 03 හැර යෝජිත අනෙක් දීමනා

ඉහත දූෂණ විරෝධී අවදානම් දීමනාව සහ කාර්ය සාධන දීමනාවට අමතරව කොමිෂන් සභාවේ නිලධාරින් හා සේවකයන් සඳහා අනෙකුත් දීමනා (අතිකාල දීමනාව/අමතර සේවා දීමනාව හා නිවාඩු දින වැටුප්, සංයුක්ත දීමනාව, ජීවන වියදම් දීමනාව, වෘත්තීය දීමනාව, ප්‍රවාහන දීමනාව, ඉන්ධන දීමනාව සහ සන්නිවේදන දීමනාව ඇතුළු අනෙකුත් දීමනාවන්) ගෙවීමේ දී රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලය සඳහා එම දීමනා හිමි ගන්වා ඇති චක්‍රලේඛ විධිවිධාන අදාළ කර ගැනීම.

(පූ.භා. 11.21 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

"ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.31 ට ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යවරිය විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.32 ට ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් සභාවේ විශේෂ අවසරය ඇතිව, ඉදිරිපත් කරන ලද යෝජනාව,— අද දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ දී සිදු කරන ලද දැනුම් දීම අනුව, සභාවේ අවසරය ඇතිව, අද දින විසිර යෑමේ දී මෙම පාර්ලිමේන්තුව 2026 මාර්තු 19 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. කල් තැබීම (සංවර්ධන නිලධාරින්ගේ වැටුප් ගැටලු විසඳීම):** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය''යි වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබූයෙන්, අ.භා. 5.38 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව, පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව අද දින සභා සම්මතිය අනුව, 2026 මාර්තු 19 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේ ය.